

දිසානායක මහතා අල වගාවට තෙල් ඉසියි

# ‘අපේ මහන්සියේ ප්‍රතිඵල අපටම ඕනෑ’

රුපියල් දහතක් අතේ තියන් එළවළු වගාවට බැස්ස ඉලන්දාරියෙක්, අද මුළු දිස්ත්‍රික්කයේම දහදිය මහන්සියේ කතාව කැටි කර දක්වන්නෙක් වෙලා. අවුරුදු දහයකට කලින් ඔහු ගත් තීරණය ගැන කිසිම කණගාටුවක් නැහැ. ඒත් එදත් අදත් ඔවුන් ගේ ශ්‍රමයේ ප්‍රතිඵල ඔවුනට ම හරිහැටි නොලැබීම ගැන ඔවුන් සැහෙන කනස්සල්ලකිනුයි, ඉන්නේ.

රටටම ‘රට’ එළවළු දෙන නුවරඑළිය දිස්ත්‍රික්කය අනික් පළාත්වල ගොවි මහත්වරුන් ගේ ඉරිසියාවට කරමක් ලක් වන එකක්. ‘‘මේවායේ අක්කර ගණනකට වැඩිය නුවරඑළියේ අක්කර කාලක් තිබුනොත් ඇති.’’ ඔවුන් කියන්නේ එහෙම යි. ඒත් නුවරඑළියේ පස රන් බවට පෙරළන්න එහි ගොවි මහත්වරු දරන වෑයම සුළු පටු නොවන බව කඳපොළ හියුබට් දිසානායක මහතා ගෙන් අපට හෙළිවුනා.

‘‘ඉස්කෝලේ යැම ඇරිලා මම කඩේක වැඩ කළා. ඔය අතරේ ලංගම රැකියාවකුත් මට ලැබෙන තැනට ආවා 1966 දී. කඳපොළ ජයලංකා නමින් තරුණ ගොවිපලක් පටන් ගන්නත් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කළේත් මේ කාලේ. මම ඒකටත් තේරුණා. මොනවා කරන්න ද කියලා හිත දෙගිඩියාවෙන් ඉන්න කොට මගේ හිතවන්තයෙක් අවවාද කළා ගොවිපලට යන්න කියලා. කඩේ මගේ වියදම් කපන් ඉතිරි වෙච්ච රුපියල් දහතත් අරන් මමත් අනික් තරුණයන් එක්ක ගොවිපලට ආවා.’’

‘‘අපිට අර්තාපල් වගාව ගැන හොඳ පුහුණුවක් ලබා දුන්නා. මෙහේ සජ්රූප අර්තපල් නේ. ඔය අතරේ රට එළවළු ගැනත්. අපි සමුපකාර තරුණ ගොවි සමිතියක් හද ගත්තා. දවස් වියදමට රුපියල් දෙක ගානේ ගෙව්වා. ඔය විදිහට අපි මෙහේ නවාතැන් ඇතිවම ගොවිතැන් කළා. අපට ගොවිතැන ගැන දැනුමක් ලැබුනාම 1969 දී එක්කෙනාට අක්කරයකුත් කාලක් වෙන හැටියට මේ අක්කර හතළිහ බෙදු දුන්නා.’’

‘‘නුවරඑළියේ ගොවි මහත්වරු හැම බිම් අඟලකින් ම උපරිම ප්‍රයෝජනය ගන්නවා. දැඩි ශීතල සුළං තියෙන කාලවලත් එයාලා එළවළු කොටුවට බැසීම අත් අරින්නේ නැහැ. මෙහේ තත්ත්වය ඇත්තට ම මේක යි. අපි අවුරුද්දකට සැරයක් විතර අල වවනවා. ඊට පස්සේ එළවළු. සමහරු අල දෙසැරයක් වවනවා. ඒත් එක පසට ඒ තරම් හොඳ නැහැ නේ. දැන් මේ පැත්තේ හැමෝට ම වාගේ බෝග මාරුවේ ප්‍රයෝජන වැටහිලා. වැඩි දෙනෙක් එහෙම යි.’’

‘‘අපේ ප්‍රශ්න පටන් ගන්නේ වගාවේ මුලදීම යි. අපි බිම සකස් කරන්න කලින් ම බීජ අල හොයන එක පටන් ගන්න ඕන. ඉස්සර අපිට බීජ අල දුන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන්. අපට ඕන තෙල් බෙහෙත් එහෙමත් තම තමන්ට ඕන කරන ප්‍රමාණය ලැබුණා. පස්සේ මේ ටික

කරන ඒක පලදවර්ධනේට බාර දුන්න නේ. අපේ ප්‍රශ්න වගාව එක්කම පටන් ගන්නවයි කියලා මම කිව්වේ ඒකයි'' දිසානායක මහතා තරමක් කෝපයෙන් කීය.

''බීජ අල පලද වර්ධන සමිතියට දෙනවා, ගොවීන්ට බෙදු දෙන්න. එතෙන් දි මේ පැත්තේ ඉන්න ගොවි මුදලාලිලා කීප දෙනා කොහොම හරි ඔය ටික ගන්නවා. ඉතින් අපි වගේ සුළු ගොවියන් බීජ අල වැඩි මිලට පිටින් ගන්න ඕන. ඉස්සර, දෙපාර්තමේන්තුවේ මහත්වරු ඕව බෙදලා දෙන කොට ඔහොම නැහැයි'', ඔහු අප සමග වූ විතානගේ හා දිසානායක කෘෂි කර්ම උපදේශක මහතුන් පෙන්වමින් කියද්දී කේන්තිය තරමක් අඩු වූ බවක් පෙණුනි.

''එතකොට අඩු තරමේ වගාව හරියට පටන් ගන්නවත් පුළුවන්. මුදලාලිලා එක්ක සටන තිබුනේ විකුණ ගන්න විතර යි. වැඩි හොඳට දුපු පලදවර්ධනේ නිසා වගාව පටන් ගන්නම මුදලාලි එක්ක සටන් කරන්න වුනා. තෙල් බෙහෙත්වල තත්ත්ව යත් එහෙම යි. අපට දෙන්න එවන තෙල් බෙහෙත් පලද වර්ධනෙන්, සමුපකාරෙන් කළු කඩයට යවනවා. ගිය ගමන මට ''ඇන්ට්‍රෝකෝල්'' හොයන්න හඟුරන්කෙතට ම යන්න වුනා. මොක ද කළු කඩේ ගණන් අපට ගෙවන්න බැරි නිසා.''

## විසඳුම්

''මේ තත්ත්වය වලක්වන්න ක්‍රමයක් නැද්ද?'' අපි ඇහුවා.

''ඇයි නැත්තේ, ඒක සුළු වැඩක්. විසඳුම් දෙකක් තියෙනවා. එකක් තමයි පලදවර්ධන වගේ සමිති නියම විදිහට සකස් කිරීම. හැබැයි අපි අත්දැකීමෙන් දන්නවා මේ තත්ත්වය යටතේ ඒක කරන්න බැරි බව. වැඩක් කෙරෙන විසඳුම නම් ආපහු මේ මහත්තුරුන්ට ම ඔය වැඩේ බාර දෙන එක යි. ඒ කිව්වේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ම. බීජ අලවලට විතරක් නොවෙයි, එළවළු ඇට ගන්නත් අපිට ඔය වගේ වැඩිය පිහිට වන්නේ කළු කඩේ තමයි.'' ඔහු අමතක වූ දෙයක් ද එකතු කලේ ය.

**ගොවි යෙදවුම්,**
**බීජ අල, එළවළු ඇට පහසුවෙන් ලබාගැනීම හා නිෂ්පාදන සාධාරණ මිලකට අලෙවි කරගැනීම විසඳුම් නැති උග්‍ර ගොවි ප්‍රශ්ණයන් වෙලා.**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින්ම යෙදවුම්, බීජඅල, එළවළු ඇට බෙද දිය යුතුයි.**

**නුවරඑළියේ එළවළු වෙන්දේසි පොලක් ඇතිකිරීම සාධාරණ මිලකට මහක්.**

**මෙම ප්‍රශ්ණවලට ගොවි මහතුන්ගේ විසඳුම් මෙවායි.**

''කොහොම හරි වගාව පටන් ගත්තයි කියමුකෝ. ඊට පස්සේ දිනපතාම අපි සැහෙන කාලයක් එළවළු නැතිනම් අල කොටුවේ ගත කරනවා. ලෙඩ රෝග හැදිල ද බලන්න. යන්තමට මතු වෙන කොටම වලක ගත්තෙ නැත්නම් යාය දිගටම යනව නේ.''

''මහත්තයා වවන එළවළු මොනවා ද?''
''කලින් කිව්ව වගේ අපට මූලිකව ම වැඩි ආදයමක් දෙන්නේ අර්තාපල්. අලවාරේ ඇරුණම අපි ලීක්ස්, කැරට්, බීට් තමයි වැඩිපුර ම වවන්නේ. ඒවාටත් හොඳ ආදයමක් ගන්න පුළුවන්. එළවළු වවන කොට අපි එක පාත්තියේ ඔය ජාති තුනම පැල කරනවා. එක එකවා මෝරන්නේ වරින් වර නේ. මෙහේ ඉඩම් හිඟ නිසායි අපි එහෙම කරන්නේ.''

''වැඩේ එපා වෙන්නේ විකුණ ගන්න ගියාම යි. එළවළු මුදලාලිගේ තැරැව් කාරයෝ එනවා ලොරි වලින්. එයාලා එන්නේ ම කුණු කොල්ලෙට ගෙන යන්න. වගාවට බැස්ස මුල් කාලේ අපි ඔකට අහුවුනා. දැනුත් අපි අහු නොවෙනවා නොවෙයි,'' ඔහු කීවේ මහත් කනස්සල්ලකිනි.

''විකුණ ගන්න බැරි වුනාම ඉතින් කීයකට හරි දීලා දන්න එපායැ. එක ගමනක්

මගෙන් අල ගත්තේ හොණ්ඩරය රු. 225 ට. මම ටිකක් හෙව්වා. එතකොට වෙළඳ පොලේ හොණ්ඩරය රු. 290 යි. තවත් දවසක් අපෙන් ලීක්ස් රාත්තල ශත විස්සට ගත්තා. එදම මාක්ෆෙඩ් එක (සමුපකාර අලෙවි සංවිධානය) ශත හැට ගණනේ ලීක්ස් ගන්න ආවා. එතකොට කොළඹ රාත්තලක් රුපියලක්, එකයි විස්සක් විතර වෙන්න ඇති.''

''මේ දවස් වල අපි ලීක්ස් රාත්තලකට 2.40 විතර ගෙවනවා.'' අපි ඔහුට කීවෙමු.

''ඒක තමයි, අපේ ශ්‍රමයයි, ඔහේල ගේ සල්ලියි දෙකම අතරමැදියන්ට. ඇත්තටම මේ එළවළු ජාවාරමේ තත්ත්වය මේකයි, දිසානායක මහතා තවත් උනන්දුවෙමින් කරුණු දක්විය. වගා කරන අපේ ශ්‍රමයයි, පාරිභෝගික ඔහේල ගේ සල්ලියි මේ අතර මැදියෝ සූරන් කනවා. ඇත්තට ම 5% තරම වන පිරිසක් 95% සූරන් කනවා. තත්ත්වය ඕක යි.''

''අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව, සමුපකාර අලෙවි සංවිධානය එහෙමත් එළවළු මිලට ගන්නවා නේ ද?'' අපි ඇහුවා. ගන්නවා. අනික් එක ඒ දෙගොල්ලම වෙළඳුන්ට වඩා සාධාරණ ඉහළ මිලක් අපිට ගෙවනවා. ඒකත් ඇත්ත. ඒත් ඒවා පිළිවෙළකට කෙරෙන වැඩ නොවෙයි. ආණ්ඩුවේ ආයතන වුනාට වැඩ නියම විදිහට කරන්නේ නැහැ. අපි කල්තියා කිව්වත් අද එළවළු කඩනවා, අල භාරනවා කියා, එක්කෝ අද එන්න වාහන නැහැ, එළවළු දමන්න පෙට්ටි, ගෝනි නැහැ, කියනවා. කිසි ප්‍රශ්නයක් නැහැ, මුදලාලිලාට. එයාලට ඕන වෙලාවට වාහන තියෙනවා. පෙට්ටි තියෙනවා. ගෝනි තියෙනවා.''

''මම උදාහරණයක් කියන්නම්. දවසක් තක්කාලි කඩන කාලෙක දෙපාර්තමේන්තුවේ ලොරියක් ඇවිත්. ගොවියෝ තක්කාලි ගන්න කියලා. එයාලා ගාව පෙට්ටි නැහැ කියලා. ටික වෙලාවකින් මුදලාලියෙකු ගේ ලොරියකුත් ඇවිත්. එයාලා ගාව පෙට්ටියි සල්ලියි දෙකම. දැන් තේරෙනවා නේද කාරනේ?''

''මේ තත්ත්වය වෙනස් කරන්නේ කොහොම ද, ඇත්තට ම නියම විසඳුම කියන්න පුළුවනුත් දිසානායක මහත්තයලට ම නේ,'' අපි කිව්වා.

''විසඳුම, දැන් තියෙන තත්ත්වය අනික් අතට හරවන එකයි. දැන් රජයේ ආයතන මගින් ගන්නේ එළවළු ටිකයි. මේ ආයතන මුදලාලිලාගේ තැරැව් කාරයෝ නොවී එළවළු මිලට ගැනීමේ මුල් තැන ගන්න ඕන. එතකොට අපිට සහතික මිලක් ලැබෙනවා.''

## දෙරණ දිනුවෝ

''එළවළු වැඩියෙන් වවන පැතිවල රජයේ මිල දී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවන්න ඕන. නුවරඑළිය, කඳපොළ, නිල්දණ්ඩාහින්න, හඟුරන්කෙත මේවාට කදිම මධ්‍යස්ථාන. පෙලක් එළවළු වැඩිකාලවල මුදලාලිලා කුණු කොල්ලයට යි ගන්නේ. මේ තත්ත්වය නැති කරන්න පුළුවන් එලවළු වෙළඳාමේ දී මුදලාලි බලපෑම නැති කර අලෙවි දෙපාර්තමේන්තුව මුල් තැන් ගත්තොත් විතර යි.''

''සමුපකාර ක්‍රමයක් මගින් මුකුත් කරන්න බැරි ද?'' ''කොහොම කරන්න ද? දැන් අපේ සමිතියත් නැහැ. අපේ ම සමහරු ඉඩම් මුදලාලිලාට බද්දට දීලා. දිසාපති තුමා මේ ළඟ දී එහෙම ඉඩම් බදුදීම තහනම් කළා.

''බීජ අල, එළවළු ඇට, පෝර, තෙල්, බෙහෙත් ආදිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ම බෙදදීලා, හදිසියක දී අවශ්‍ය වන මුදල් රජයේ බැංකු වැනි ආයතනයකින් දීලා, අපේ නිෂ්පාදන අලෙවි දෙපාර්තමේන්තුව මගින් මිලට ගන්නවා නම් එළවළු ගොවි ජනතාවට ප්‍රශ්න නැහැ.'' ඔහු කීය.

රුපියල් දහතක් ඇතැතිව ගොවිතැනට බැස්ස කඩවසම් ඉලන්දරියා දැන් දරු තිදෙනෙකු ගේ පියෙක්. මේ සැරේ අල හැරුවාම ගොවිපලට ප්‍රයෝජන වෙන ට්‍රැක්ටරයක් ගන්නත් හිතේ අදහසක් තියෙනවා. ජය ලංකාවේ ඉඩම්, ගොවීන්ට ම පවරා දෙන්න රජය කටයුතු කරන බව දැන ගන්නට ලැබීම ඔවුන් තවත් දිරිගන්වන හේතුවක් වෙලා.